සියලුම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
[All rights reserved]

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Division of Piriven Education
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

**මධ්‍යවාර පරීක්ෂණය - 2025**

| 09 | S | I, II |
|---|---|---|

**05 - ශ්‍රේණිය**

පැය තුනයි.

**(09) සෞඛ්‍ය විද්‍යාව - I,II**

අමතර කියවීම් කාලය- විනාඩි 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සෞඛ්‍ය විද්‍යාව - I පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ x ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

**1.** පූර්ණ සෞඛ්‍යයට අදාළ විනයගරුක බව, ප්‍රබෝධයෙන් සිටීම, නිවැරදි තීරණ ගැනීම, මානසික පීඩනය පාලනය කර ගැනීම යන අංගවලට ගැළපෙන වරණය තෝරන්න.

**(1)** කායික යහ පැවැත්ම **(2)** මානසික යහ පැවැත්ම
**(3)** සමාජීය යහ පැවැත්ම **(4)** අධ්‍යාත්මික යහපැවැත්ම

**2.** මානව පරිණාමවාදයේ පියා ලෙස සැලකෙන්නේ,

**(1)** ඇරිස්ටෝටල් ය. **(2)** කාල් මක්ස් ය. **(3)** චාල්ස් ඩාවින් ය. **(4)** ආකිමිඩීස් ය.

**3.** ආයුර්වේදයට අනුව "ආයු" යන්නෙහි අර්ථය කුමක් ද?

**(1)** නුවණ **(2)** ආයුෂ **(3)** සැප **(4)** හිත බව

**4.** පහත දැක්වෙන පද්ධති අතරින් පරිවෘත්තීය ක්‍රියාවලින් ජනනය වන නිෂ්ප්‍රයෝජනවත් ද්‍රව්‍ය බැහැර කිරීමට ඉවහල් වන පද්ධතිය කුමක් ද?

**(1)** ආහාර ජීරණ පද්ධතිය **(2)** රුධිර සංසරණ පද්ධතිය
**(3)** බහිස්ශ්‍රාවී පද්ධතිය **(4)** ස්නායු පද්ධතිය

**5.** ආහාරවල සුරක්ෂිතතාව කෙරෙහි බලපාන ජීව විද්‍යාත්මක සාධකයක් වන්නේ මින් කුමක් ද?

**(1)** ක්ෂුද්‍ර ජීවීන් **(2)** කෘමිනාශක **(3)** රසායනික පොහොර **(4)** ගල්, වැලි


www.pirivena.lk

**6.** පහත දැක්වෙන රෝග අතරින් ආහාර නරක් වීමෙන් වැළදෙන රෝගය කුමක් ද?

**(1)** බරවා රෝගය **(2)** ක්ෂයරෝගය **(3)** පාචනය **(4)** අසාතය

**7.** අස්ථි හා සන්ධි අනතුරු අතුරින් අස්ථි දෙක එකට බැඳ තබන බන්ධන වලට හානි පැමිණීම හඳුන්වන්නේ,

**(1)** භග්න වීම යනුවෙනි. **(2)** උලුක්කුවීම යනුවෙනි.

**(3)** සන්ධි වීම යනුවෙනි. **(4)** විසන්ධි වීම යනුවෙනි.

**8.** සර්පයෙකු දෂ්ට කළ පසු නොකළ යුතු කාර්යය වනුයේ,

**(1)** රුගියාගේ බිය තුරන් කිරීම.

**(2)** රෝගියාගේ දෂ්ට කළ ස්ථානය සබන් ගා සේදීම.

**(3)** දෂ්ට කළ ස්ථානයට මුව තබා විෂ උරා ඉවත් කිරීම.

**(4)** රෝගියා නොසෙල්වීමට සැලැස්වීම.

**9.** මානසික හා අධ්‍යාත්මික සුවය පිණිස වඩා වැදගත් කරුණ දැක්වෙන වරණය කුමක් ද?

**(1)** පරිසරය පවිත්‍රව තබා ගැනීම. **(2)** පිරිසිදු ජලය පානය කිරීම.

**(3)** සුදුසු භාවනාවක යෙදීම. **(4)** සමබල ආහාර පරිභෝජනය කිරීම.

**10.** පාරම්පරික ක්‍රම අනුව සකසාගත් ආහාර පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

**(1)** කොළ කැඳ, තෙම්පරාදු බත්, පිට්ටු, හත් මාළුව

**(2)** හත්මාලුව, කොළ කැඳ, නූඩ්ලස්, තැම්බුම් හොදි

**(3)** කොළ කැඳ, තෙම්පරාදු බත්, රොටී, කලවම් පලා මැල්ලුම

**(4)** හත්මාලුව, කලවම්පලා මැල්ලුම, කොළ කැඳ, තැම්බුම් හොදි

**11.** මිනිස් සිරුර තුළ රෝගවලට ඔරොත්තු දීම සඳහා ස්වභාවයෙන් ම පිහිටි ශක්තිය හා හැකියාව,

**(1)** ප්‍රතිශක්තියයි. **(2)** කෘත්‍රිම ප්‍රතිශක්තියයි.

**(3)** ස්වභාවික ප්‍රතිශක්තියයි. **(4)** පාරිසරික ප්‍රතිශක්තියයි.

**12.** ළදරුවෙකු ඉපදී පැය 24 ක් ඇතුළත ලබාදෙන BCG එන්නත මගින් වලක්වා ගත හැකි රෝගය මින් කුමක් ද?

**(1)** ක්ෂයරෝගය **(2)** ගලපටලය **(3)** පිටගැස්ම **(4)** ඉන්ෆ්ලුවන්සාව

**13.** පහත සඳහන් කරුණු වලින් පෙනහළු පිළිකා ඇතිවීමට ප්‍රධාන හේතුව කුමක් ද?

**(1)** මත්පැන් පානය **(2)** දුම්පානය

**(3)** රසකාරක හා වර්ණක අඩංගු ආහාර පාන **(4)** වායු දූෂණය

**14.** ස්නායු පද්ධතියට අයත් මස්තිස්කය, අනුමස්තිස්කය, සුෂුම්නා ශීර්ෂකය, යන කොටස් සම්බන්ධ වන්නේ,

**(1)** මොළයට **(2)** සුෂුම්නාවට **(3)** කපාල ස්නායුවට **(4)** සුෂුම්නා ස්නායුවට

**15.** ස්නායු පද්ධතිය ආශ්‍රිත රෝගාබාධ අතුරින්,

* ශරීරයේ ඇතිවන කරකැවිල්ල.
* වචන පිට කිරීම පටලැලි සහිතවීම හා ගොත ගැසීම.
* ශරීරයේ කොටස් අප්‍රාණික වීම
* මුහුණ අතපය පැත්තකට ඇදවීම

ආදී රෝග ලක්ෂණ හා සම්බන්ධ රෝගී තත්ත්වය මින් කුමක් ද?

**(1)** පෝලියෝ **(2)** අපස්මාරය **(3)** අංශභාගය **(4)** ජලභීතිකාව


www.pirivena.lk

**16.** බෝ නොවන රෝග වැළඳීමට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ,

**(1)** ජානමය සාධක **(2)** අයහපත් ජීවන රටා

**(3)** අයහපත් ජීවන රටා හා ජානමය සාධක **(4)** අනාරක්ෂිත ලිංගික සම්බන්ධතා

**17.** මොළයෙන් ආරම්භ වන ස්නායු යුගල් ගණන ................ කි.

**(1)** 12 කි. **(2)** 09 කි. **(3)** 33 කි. **(4)** 60 කි.

**18.** රුධිර ප්ලාස්මයේ වැඩි වශයෙන් ම අඩංගු ද්‍රව්‍ය මින් කුමක් ද?

**(1)** නයිට්‍රජන්, ඔක්සිජන්, කාබන් ඩයොක්සයිඩ් වැනි වායු වර්ග

**(2)** ජලය

**(3)** හෝමෝන වර්ග **(4)** විවිධ ප්‍රෝටීන් වර්ග

*** 19 හා 20 ප්‍රශ්න පහත තොරතුරු මත පදනම් වේ.**

සම්බෝධි පිරිවෙනෙහි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 4 (හතර) නමකගේ රුධිර ගණ පහත දැක්වේ.

| ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගේ නම | රුධිර ගණය |
|---|---|
| සුසීල හිමි | A |
| රාහුල හිමි | B |
| විනීත හිමි | AB |
| චන්දිම හිමි | O |

**19.** ඉහත රුධිර ගණ පිළිබඳ තොරතුරු අනුව ඕනෑම අයෙකුට රුධිරය පරිත්‍යාග කළ හැකි භික්ෂූන් වහන්සේ කවුරුන් ද?

**(1)** සුසීල හිමි **(2)** රාහුල හිමි **(3)** විනීත හිමි **(4)** චන්දිම හිමි

**20.** ඕනෑම අයෙකුගෙන් රුධිරය ලබා ගත හැකි භික්ෂූන් වහන්සේ වන්නේ,

**(1)** සුසීල හිමි **(2)** රාහුල හිමි **(3)** විනීත හිමි **(4)** චන්දිම හිමි

**21.** හෘදයේ ක්‍රියාකාරීත්වයේ දී වැඩිම පීඩනයක් ඇතිවන්නේ,

**(1)** වම් කර්ණිකාවේ ය. **(2)** දකුණු කර්ණිකාවේ ය.

**(3)** වම් කෝෂිකාවේ ය. **(4)** දකුණු කෝෂිකාවේ ය.

**22.** අංගුත්තර නිකායේ රෝග සූත්‍රයේ සඳහන් පරිදි මිනිසාට වැළඳෙන මානසික රෝග හට ගන්නා අකුසල මූල තුන,

**(1)** ලෝභ, ද්වේශ, මෝහ වේ. **(2)** වාත, පිත, සෙම වේ.

**(3)** ආපෝ, තේජෝ, වායෝ වේ. **(4)** ජාති, ජරා, ව්‍යාධි වේ.

**23.** මිනිස් සිරුරේ පටක පමණක් අඩංගු වරණය තෝරන්න.

**(1)** රුධිරය, පෙනහළු, පේෂි සහ ස්නායු වේ. **(2)** රුධිරය, පේෂි, අස්ථි සහ හෘදය වේ.

**(3)** අක්මාව, අස්ථි, ස්නායු සහ පේෂි වේ. **(4)** අස්ථි, පේෂි, ස්නායු සහ රුධිරය වේ.


www.pirivena.lk

**24.** අපිජිහ්විකාව නැමැති කාටිලේජ පියන්පත සවි වී ඇත්තේ ආහාර ජීර්ණ පද්ධතියේ කුමන කොටසට ද?

**(1)** මුඛයට **(2)** ග්‍රසනිකාවට **(3)** අන්නශ්‍රෝතයට **(4)** ක්ෂුද්‍රාන්ත්‍රයට

**25.** ආහාර ජීරණ පද්ධතියේ ජීරණය හා අවශෝෂණය යන කාර්යයන් දෙකම ඉටුකරන ඉන්ද්‍රිය කුමක් ද?

**(1)** අන්නශ්‍රෝතය **(2)** ආමාශය **(3)** ක්ෂුද්‍රාන්ත්‍රය **(4)** මහාන්ත්‍රය

**26.** බහිස්ශ්‍රාවී ද්‍රව්‍යයක් වන දහදිය නිපදවන්නේ සමේ ඇති කුමන ව්‍යුහය මගින් ද?

**(1)** අපිචර්මය **(2)** රුධිර කේශනාලිකා **(3)** ස්වේද ග්‍රන්ථි **(4)** ස්නේහශ්‍රාවී ග්‍රන්ථි

**27.** රාහුල හිමිට ළඟ පිහිටි වස්තු පැහැදිලිව පෙනුන ද දුර පිහිටි වස්තු පැහැදිලිව නොපෙනෙන බව පවසයි. උන්වහන්සේට වැළඳී ඇති දෘෂ්‍යාබාධය,

**(1)** දුර දෘෂ්ටිකත්වය යි. **(2)** අවිදුර දෘෂ්ටිකත්වය යි. **(3)** වර්ණ අන්ධතාවය යි. **(4)** හතළිස් ඇඳිරිය යි.

**28.** මිනිස් සිරුරේ පරිවෘත්තීය ක්‍රියා ඉටුකරන්නේ,

**(1)** සෛල මගිනි. **(2)** පටක මගිනි. **(3)** අවයව මගිනි. **(4)** පද්ධති මගිනි.

**29.** රුධිර සංසරණ පද්ධතිය හා සම්බන්ධ රෝගයක් වන ත්‍රොම්බෝසිස් නිසා ක්ෂණිකව ඇති විය හැකි අවදානම් තත්ත්වය නම්,

**(1)** ලියුකේමියාවයි. **(2)** හිමෝෆීලියාවයි. **(3)** හෘදයාබාධයයි. **(4)** නිරක්තියයි.

**30.** නිර්වායු ශ්වසනයේ දී අතුරුඵලයක් ලෙස නිපදවන්නේ,

**(1)** කාබන්ඩයොක්සයිඩ් වායුවයි. **(2)** ලැක්ටික් අම්ලයයි.

**(3)** ඔක්සිජන් වායුවයි. **(4)** ඇමයිනෝ අම්ලයයි.

**31.** පහත දී ඇති රෝග අතුරෙන් බැක්ටීරියාවක් මගින් බෝ නොවන රෝගය කුමක් ද?

**(1)** ක්ෂයරෝගය **(2)** පාචනය **(3)** ඉන්ෆ්ලුවන්සාව **(4)** මී උණ

**32.** මැද කන හා උගුර සම්බන්ධ කරන නාලය වනුයේ මින් කවරක් ද?

**(1)** ශ්‍රවණ නාලය **(2)** රුධිර නාලය **(3)** අර්ධ චක්‍රාකාර නාල **(4)** යුෂ්ටේකීය නාලය

**33.** පුද්ගලයකු බියට හෝ කෝපයට පත් වූ අවස්ථාවක ශ්‍රාවය වන හෝමෝනය වන්නේ,

**(1)** ඇඩ්‍රිනලින් **(2)** ඊස්ට්‍රජන් **(3)** නෝරඇඩ්රිනලින් **(4)** කෝටිසෝල්


www.pirivena.lk

**34.** රුධිර සංසරණ පද්ධතියේ කිසියම් නාල වර්ගයක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

* බිත්ති තුනීය ප්‍රත්‍යාස්ථ පටක අඩුය.

* අභ්‍යන්තරයේ කපාට ඇත.

* රුධිරයේ ඔක්සිජන් සාන්ද්‍රණය අඩු අතර කාබන්ඩයොක්සයිඩ් සාන්ද්‍රණය වැඩිය.

මෙම ලක්ෂණ සහිත නාල වර්ගය කුමක් ද?

**(1)** ධමනි **(2)** ශිරා **(3)** කේශනාලිකා **(4)** ධමනි හා ශිරා

**35.** රතු රුධිරාණු සෛලවල ප්‍රධාන කාර්යය වන්නේ,

**(1)** රුධිරය කැටි ගැසීමට දායකවීම ය. **(2)** සිරුර තුළ ප්‍රතිදේහ නිපදවීම ය.

**(3)** සිරුර තුළ ඔක්සිජන් වායුව පරිවහනය කිරීම ය. **(4)** සිරුර තුළට ඇතුළු වන විෂ බීජ භක්ෂණය කිරීම ය.

**36.** ප්ලස්මෝඩියම් නම් ඒක සෛලික පරපෝෂිතයා නිසා සෑදෙන රෝගයකි.

**(1)** ඇමීබා අතීසාරය **(2)** කොළරාව **(3)** මැලේරියාව **(4)** බරවා

**37.** ඵලදායීතාව නැංවීමට ඉවහල් වන කළමනාකරණය සඳහා වන 3R සංකල්පයට අයත් නොවන අංගය තෝරන්න.

**(1)** නැවත භාවිතය. **(2)** දහනය කිරීම.

**(3)** ප්‍රතිචක්‍රීකරණය **(4)** ඉවතලන ද්‍රව්‍ය භාවිතය අවම කිරීම.

**38.** සංඝයා වහන්සේගේ ආරාම දෙවර්ගය අතුරින් "උද්‍යාන ආරාම" එක් වර්ගයකි. අනෙක් ආරාම වර්ගය හඳුන්වන්නේ,

**(1)** ගිරි ආරාම වශයෙනි. **(2)** ශිඛර ආරාම වශයෙනි.

**(3)** උධක ආරාම වශයෙනි. **(4)** වේළුවන ආරාම වශයෙනි.

**39.** බුදු දහමට අනුව "ආරෝග්‍ය" යන්නෙහි අර්ථය වන්නේ,

**(1)** කායික රෝගවලින් තොර වීම ය. **(2)** ජීවිතය ගැන අවබෝධය යි.

**(3)** කායික මානසික නිරෝගීතාවය යි. **(4)** සතුට සොම්නස ඇති වීම යි.

**40.** "භූතගාම" අනුව පුරුක් වලින් වෘක්ෂ හටගන්නා ක්‍රමය හඳුන්වා ඇත්තේ,

**(1)** මූල බීජං ලෙසිනි. **(2)** ඛන්ධ බීජං ලෙසිනි. **(3)** ඵළු බීජං ලෙසිනි. **(4)** අග්ග බීජං ලෙසිනි.


www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
[முபஜப் பதிப்பகுரிமையகூடையது]
[All rights reserved]

අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Division of Piriven Education
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 09 | S | I, II |
|---|---|---|

# මධ්‍යවාර පරීක්ෂණය - 2025

## 05 ශ්‍රේණිය

## (09) සෞඛ්‍ය විද්‍යාව - I,II

## සෞඛ්‍ය විද්‍යාව - II පත්‍රය

**සැලකිය යුතුයි:**

- **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය.**
- **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි (05).**

**1.** බුද්ධ ජයන්ති පිරිවෙනෙහි ආරාධනයෙන් පැමිණි ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තුමා විසින් සෞඛ්‍ය විද්‍යා විෂය හදාරන සිසුන් සඳහා "රුධිර සංසරණ පද්ධතිය" පිළිබඳ විශේෂ දේශණයක් පවත්වන ලදී.

මිනිස් සිරුර අසිරිමත් නිර්මාණයක් බවත් මූලික තැනුම් ඒකකය වන සෛලයෙන් ආරම්භ වී ජීවියෙකු නිර්මාණය වී ඇති ආකාරය ගැලීම් සටහනක් ඇසුරින් පැහැදිලි කරන ලදී. සිරුරේ විවිධ කාර්යයන් ඉටු කරන පද්ධති හා ඒවායේ මනා පැවැත්මට ඉවහල් වන කරුණු දැන ගැනීමේ වැදගත්කම ද සිහිපත් කරන ලදී.

ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ යොදා ගනිමින් රුධිර සංසරණ පද්ධතිය සැකසී ඇති ආකාරය පැහැදිලි කළ වෛද්‍ය නිලධාරි තුමා එහි ප්‍රධාන ඉන්ද්‍රිය වන හෘදයෙහි ස්වභාවයත් ක්‍රියාකාරීත්වයත් විස්තර කරන ලදී. රුධිර සෛල, රුධිර සංසරණයට ඉවහල් වන රුධිර නාල හා ඒවායෙහි විශේෂ ලක්ෂණ ද සඳහන් කළේ ය.

රුධිර සංසරණ පද්ධතියේ මනා පැවැත්මට හදිසි අනතුරු වැනි අධිකව රුධිරය වහනය විය හැකි අවස්ථා හා රෝගී අවස්ථා වළක්වා ගැනීම මෙන් ම එවැනි අවස්ථාවල නිවැරදිව රෝගීන් කළමනාකරණය කර ගැනීම අත්‍යවශ්‍ය බවත් සඳහන් කරන ලදී. ඇතැම් හදිසි අනතුරු හා රෝගී අවස්ථාවලට ලක් වූ අයගේ ජීවිත බේරා ගැනීමට රුධිර පාරවිලයනය කිරීමට පවා සිදු වන බව සිහිපත් කරන ලදී.

එසේ ම රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත බෝ නොවන රෝග අතුරින් වැඩි අවධානයට ලක්ව ඇති හෘදයාබාධ රෝගයෙහි පසුබිම හා එහි අවධානම පිළිබඳවත් පැහැදිලි කරන ලදී. එවැනි අවදානමෙන් මිදීමට, මත්පැන් පානයෙන් වැලකීම ආදී යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කළ යුතු බව පෙන්වා දුන්නේ ය. එසේ ම බෞද්ධ ඉගැන්වීම් අනුව කටයුතු කිරීමෙන් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කළ හැකි බවත් පැහැදිලි කරන ලදී.

මෙම සිද්ධිය ඇසුරෙන් **(i)** සිට **(x)** තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

**(i)** සිද්ධියේ සඳහන් වූ සෛල වලින් ආරම්භ වී ජීවියකු නිර්මාණය වන ආකාරය දැක්වෙන ගැලීම් සටහන පහත දක්වා ඇත. එහි අංක 1 හා 2 යොදා ඇති ස්ථානවලට නියමිත වචන ලියන්න.

සෛල ⟶ **1** ⟶ **2** ⟶ පද්ධති ⟶ ජීවියා

**(ii)** රුධිර සංසරණ පද්ධතිය හැර වෙනත් මානව දේහ පද්ධති **දෙකක්** සඳහන් කරන්න.

**(iii)** රුධිර සංසරණ පද්ධතියේ ප්‍රධාන රුධිර වාහිනී වර්ග **දෙක** ලියා දක්වන්න.

**(iv)** හෘදයෙහි ප්‍රධාන කුටීර **හතර** නම් කරන්න.

**(v)** රතු රුධිරාණුවල ලක්ෂණ **දෙකක්** ලියා දක්වන්න.

**(vi)** සිද්ධියේ සඳහන් වූ හදිසි අනතුරු අවස්ථා හැර රුධිර පාරවිලයනය අවශ්‍ය විය හැකි වෙනත් අවස්ථා **දෙකක්** ලියන්න.

**(vii)** රුධිර පාරවිලයනයේ දී සැලකිය යුතු කරුණු **දෙකක්** ලියන්න.

**(viii)** සිද්ධියේ සඳහන් වූ රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත බෝ නොවන රෝගය හැර වෙනත් බෝ නොවන රෝග **දෙකක්** සඳහන් කරන්න.

**(xi)** හෘදයේ ක්‍රියාකාරීත්වය යහපත්ව පවත්වා ගැනීමට හේතු වන සිද්ධියේ සඳහන් නොවන වෙනත් ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

**(x)** බෞද්ධ ඉගැන්වීමක් වන මැදුම් පිළිවෙතට පටහැනි ක්‍රම **දෙක** සඳහන් කරන්න.

***(ලකුණු 2×10=20)***

**02. (i)** ලෝක සෞඛ්‍ය සංවිධානයේ අර්ථ දැක්වීම අනුව "**සෞඛ්‍යය**" යනු කුමක් දැයි හඳුන්වන්න. ***(ලකුණු 02)***

**(ii)** සෞඛ්‍යවත් සමාජයක් බිහි කිරීමට ඉවහල් වන පිළිවෙත් **තුනක්** සඳහන් කරන්න. ***(ලකුණු 03)***

**(iii) (අ)** ආහාර නරක් වීමට බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න. ***(ලකුණු 02)***

**(ආ)** ආහාර නරක් වීමේ ප්‍රතිඵල **තුනක්** ලියන්න. ***(ලකුණු 03)***

**03. (i)** මිනිසාට රෝග ඇති කරන රෝග කාරකයන් සඳහා නිදසුන් **දෙකක්** සඳහන් කරන්න. ***(ලකුණු 02)***

**(ii)** මී උණ රෝගයේ රෝග ලක්ෂණ අතුරින් **තුනක්** සඳහන් කරන්න. ***(ලකුණු 03)***

**(iii)** මී උණ රෝගය වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **පහක්** සඳහන් කරන්න. ***(ලකුණු 05)***


www.pirivena.lk

**04. (i)** සෙනසුන තුළ සෞඛ්‍ය රැකෙන පරිදි ක්‍රියා කිරීමට බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ කරුණු අතුරින් **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02)*

**(ii)** සෞඛ්‍යවත් සමාජීය පරිසරයක ලක්ෂණ **තුනක්** ලියා දක්වන්න. *(ලකුණු 03)*

**(iii) (අ)** බුදු දහම අනුව ඇතැම් රෝග කර්ම විපාක, විෂම පරිහරණ හා උපක්‍රම යන අපගේ පෞද්ගලික හේතු මත වැළදේ. මෙහි **විෂම පරිහරණය** යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02)*

**(ආ)** මානසිකව කෙරෙන ගුණාත්මක වර්ධනයකින් මෙවැනි රෝග මඟ හරවා කායික හා මානසික සනීපාරක්ෂාව ඇති කර ගත හැකි බව සනාථ කිරීමට උදාහරණ **තුනක්** දක්වන්න. *(ලකුණු 03)*

**05. (i)** ශ්වසන පද්ධතියේ නාස් විවරවල සිට ගර්ථ/පෙනහළු දක්වා ආශ්වාස වාතය ගමන් ගන්නා මාර්ගය ගැලීම් සටහනකින් දක්වන්න. *(ලකුණු 02)*

**(ii)** ශ්වසන පද්ධතියට වැළඳෙන බෝ නොවන රෝග සඳහා නිදසුන් **තුනක්** දක්වන්න. *(ලකුණු 03)*

**(iii) (අ)** ඉහත (ii) කොටසේ ඔබ දැක්වූ රෝග අතුරින් එක් රෝගයක රෝග ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

**(ආ)** ශ්වසන රෝග වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි සෞඛ්‍ය පුරුදු **තුනක්** ලියන්න. *(ලකුණු 03)*


**06. (i)** මුඛයේ ඇති මූලික දත් වර්ග හතර නම් කරන්න. *(ලකුණු 02)*

**(ii)** ආහාර ජීරණයේ දී මුඛයේ දායකත්වය කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 03)*

**(iii) (අ)** ආහාර ජීරණ පද්ධතිය ආශ්‍රිත රෝග **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02)*

**(ආ)** ආහාර ජීරණ පද්ධතියේ යහ පැවැත්ම සඳහා අනුගමනය කළ යුතු යහ පුරුදු **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03)*

**07. (i)** මිනිසාගේ මුත්‍රවාහිනි පද්ධතියේ රූප සටහනක් පහත දැක්වේ. එහි A, B,C හා D අක්ෂර වලින් දක්වා ඇති කොටස් නම් කරන්න. *(ලකුණු 02)*




**(ii)** බහිස්ශ්‍රාවී පද්ධතිය ආශ්‍රිත රෝග අතුරින් **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03)*

**(iii)** බහිස්ශ්‍රාවී පද්ධතියේ යහපැවැත්ම සඳහා අනුගමනය කළ යුතු යහපත් පුරුදු **පහක්** සඳහන් කරන්න. *(ලකුණු 05)*

**08. (i)** අක්ෂි ගෝලයේ බිත්තියේ ස්ථර තුන අතුරින් දෘෂ්ටි විතානයෙහි ඇති ආලෝකයට සංවේදී සෛල වර්ග දෙක සඳහන් කරන්න. *(ලකුණු 02)*

**(ii)** වර්තමානයේ සුලභව දැකිය හැකි අක්ෂි රෝගයක් වන දුර දෘෂ්ටිකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 03)*

**(iii)** ඇස හැර වෙනත් සංවේදී ඉන්ද්‍රියයන් **තුනක්** දක්වා ඉන් එක් ඉන්ද්‍රියයක් ආරක්ෂා කර ගැනීමට අනුගමනය කළ යුතු පිළිවෙත් **දෙකක්** ලියන්න. *(ලකුණු 05)*


www.pirivena.lk